
අ පොස (සා පෙළ) 2025 අනුමාණ
ප්‍රශ්ණ පත්‍ර අංක-02
චිත්‍ර කලාව-1 පත්‍රය

කාලය පැය-01 යි

සැලකිය යුතුයි.

සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

- **පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු අදාල තිත් ඉරිමත ලියන්න.**



1. අනුරාධපුරයට අයත් මෙම ලෙන් විහාරය ..... නමින් හැඳින්වෙයි
2. ක්‍රිස්තු පූර්ව තුන් වන සියවසේ ..... රජු විසින් කරවන ලද්දකි
3. මෙහි දක්නට ඇති කැටයම් වස්තු විෂය හා රූප සංරචනය සඳහා හින්දු ආගමික සංකල්ප මෙන්ම ගුප්ත හා ..... කලා නිර්මාණ වල ආභාසය ලැබී ඇත
4. මෙම ගල් පර්වත බිත්තියේ දක්නට ඇති සත්ත්ව හා මානව රූ කැටයම ..... නමින් හැඳින්වෙයි.
5. මහාචාර්ය සෙනරත් පරණවිතානයන්ගේ අදහසට අනුව ..... කැටයමින් සාලිය අශෝකමාලා නිරූපණය වන බවයි.

- **අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.**

6. බෞද්ධ විහාර සිතුවම් කලාව නව මහකට යොමු කරමින් ශ්‍රී ලාංකේය හා ඉන්දීය සම්භාව්‍ය චිත්‍ර කලාව ගුරු කොට ගනිමින් ඇඳි දේශීය අග්‍රගණ්‍ය චිත්‍ර ශිල්පියා කවුද?.....
7. ආකාශ පර්යාවලෝකනය විදහා දැක්වෙන අයුරින් සිතුවම් කර ඇති අනෝතප්ත විල නැමැති සිතුවම දක්නට ඇති විහාරය කුමක්ද?.....
8 “ගඩලාදෙණිය”, “උළු පෝරණුව” නැමැති සිතුවම් ඇතුළු දියසායම් මාධ්‍යයෙන් ඇඳි චිත්‍ර ගණනාවක් ඇඳී ලාංකේය සිත්තරා කවුද?
.....
9. අමර්ණා යුගයට අයත් සිහින් ගෙලක් සහ දිගටි ඔටුන්නක් සහිත හුනුගල් මාධ්‍යයෙන් කර ඇති, වර්ණාලේපිත උඩුකය මූර්තියකුමක්ද?.....
10. ස්පාඤ්ඤයේ බාසිලෝනාහි නගරයක සැරිසරන අභිසාරිකාවන්, ගුවර්නිකා යන සිතුවම් නිර්මාණය කළ ශිල්පියා කවුද?
.....

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

11. ශ්‍රී ලංකාවේ පාරම්පරික කලා කර්මාන්ත අතරින් දැව මාධ්‍යයෙන් පමණක් භාවිත කෙරෙන්නා වූ කලා ශිල්පීය ලක්ෂණ ඇතුළත් ක්‍රම දෙකක් වනුයේ.
    (1) වාත්තු කිරීම හා ඉදිකිරීම. (2) වාත්තු කිරීම හා නියපොතු වැඩ
    (3) නියපොතු වැඩ හා ලකුණු කැපීම (4) ලකුණු කැපීම හා වාත්තු කිරීම

12. දහඅට වන ශත වර්ෂයේ මහනුවර යුගයේ ප්‍රචලිත වූ බිතු සිතුවම් කලා සම්ප්‍රදායේ කැපී පෙනෙන සුවිශේෂී වූ ලක්ෂණයක් වනුයේ,
    (1) දෘෂ්ටිගත පර්යාවලෝකනය නොසැලකීම. (2) අඛණ්ඩ කරන විලාසයෙන් සංරචනය කිරීම.
    (3) සීමිත වර්ණ මාලාවක් පමණක් භාවිත කිරීම. (4) හැඩතල බහුල වශයෙන් දැකගත නොහැකි වීම.

13. මානව දේහය සුන්දරත්වය කඩවසම් බව හා රිද්මය මැනවින් නිරූපණය වන සේ ස්වභාවික ශෛලියෙන් නිරූපණය කර ඇති මූර්තිය වනුයේ,
    (1) පියෙටා (2) ඩේවිඩ්
    (3) මෝසස් (4) මිය යන වහලා

14. ඉසුරුමුණියේ පිහිටි ගලෙහි නෙළා ඇති ඇතුන් දිය ක්‍රීඩාවෙහි යෙදෙන විලාසය දැක්වෙන කැටයමින් නිරූපණය වනුයේ,
    (1) චෝල කලා ලක්ෂණයි. (2) ගුප්ත කලා ලක්ෂණයි.
    (3) පල්ලව කලා ලක්ෂණයි. (4) පාණ්ඩ්‍ය කලා ලක්ෂණයි.

15. කහ පැහැයෙන් යුත් පසුබිමක් ඇති චිත්ත රෙද්දක මල් සැරසිලි යොදා ඇත්තේ දම් පැහැයෙනි. ඒ අනුව මෙහි යොදාගෙන ඇති වර්ණ කාණ්ඩය වනුයේ,
    (1) ද්විතීක වර්ණ. (2) සංගත වර්ණ.
    (3) විසංගත වර්ණ. (4) මූලික වර්ණ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා වී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී A,B,C,D,E යන රූපසටහන් උපයෝගී කරගන්න.**


A


B


C


D


E

16. A අක්ෂරයෙන් දැක්වෙන තිබ්ස්වල නෙබාමුන් සොහොන් ගැබෙන් හමුවී ඇති මෙම වර්ණ සිතුවම කුරුලු දඩයම වන අතර එය අයත් වනුයේ කිනම් යුගයකට
    ද? .....

17. B අක්ෂරයෙන් දැක්වෙන පුබුදු යුගයට අයත් පැරණි ග්‍රීක දාර්ශනික ඇතැන්ස් ගුරුකුලය නැමැති සිතුවම දක්නට ඇත්තේ කිනම් ස්ථානයක
    ද?.....

18. C අක්ෂරයෙන් දැක්වෙන තාවඩි මූතුරෙයිසාමි ශිල්පියා විසින් අඳින ලද සුදු කුකුළා නැමැති සිතුවම දක්නට ලැබෙනුයේ
    කිනම් ස්ථානයක ද? .....


19. D අක්ෂරයෙන් දැක්වෙන ඩේවිඩ් පේන්ටර් චිත්‍ර ශිල්පියා විසින් අඳින ලද සිතුවම කිනම් නමකින් හැඳින්වේ ද?
    .....

20. E අක්ෂරයෙන් දැක්වෙන ජෝර්ජ් කීට් මහතා විසින් කොළඹ යුගයේ ඇඳි සිතුවම දක්නට ලැබෙනුයේ කිනම් ස්ථානයක ද?
    .....

- ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් දී ඇති රූප වලට වඩා සෘජු සම්බන්ධතාවය දැක්වෙන රූප සටහන ඒ ඉදිරියේ ඇති **F,G,H,I,J,K,L,M,N,O,P,Q,R,S,T** යන රූප සටහන් අතුරින් තෝරා එහි අක්ෂරය තිත්ඉරි මත ලියන්න.

21.  .....

22.  .....

23.  .....

24.  .....


25.  .....

F 

G 

H 

I 

J 

K 

L 

M 

N 

O 

P 

Q 

R 

S 

T 

- ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

26. ක්ෂය වෘද්ධි - .....

27. රංජිත වීදුරු - .....

28. ඇලැක්සැන්ඩ්‍රෝස් - .....

29. පෙතිකඩ චිත්‍ර - .....

30. කැලියොග්‍රැෆි - .....

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවල දී ඇති වැකිවල හිස් තැනට සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.**

31. මහනුවර සිතුවම් කලාවෙන් අලංකාර වූ මැදවෙල විහාරය නිර්මාණ ශිල්ප ක්‍රම අතින් වැදගත් වනුයේ එය ..... වන නිසා ය.


32. පායම් පැහීම, සන කැපීම, ලකුණු කැපීම, කිරි හිඳවීම ආදී ශිල්ප ක්‍රම භාවිතයට ගැනෙනුයේ පාරම්පරික ජන කලාවක් වූ .....කර්මාන්තය සඳහා ය.

33. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමුවූ .....නැමැති මුද්‍රාව පශුපති හෝ ශිවගේ මූලාදර්ශයක් විය හැකි යැයි ජෝන් මාෂල් නැමැති පුරා විද්වතා පවසා ඇත.

34. .....ශිල්පියා විසින් අඳිනු ලැබූ "යකදුරාගේ දියණිය" "වඩුවාගේ ගෙදර" (විරැකියාව) නැමැති තෙල් සායම් චිත්‍ර දක්නට හැකි වනුයේ කොළඹ ජාතික කලාභවනේ ය.

35. වේදනාව, බිය, ත්‍රාසය මැනවින් නිරූපණය කෙරෙන කිරිගරුඬ පාෂාණයෙන් නිමවූ..... මූර්තිය ග්‍රීක හෙලනිස්ටික් මූර්ති කලාවේ අභිමානය කියාපෑමට සමත් විය.

- **මෙහි දැක්වෙන සිතුවම හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකා වලට අදාළව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.**



36. ශිල්පියා පිළිබඳව - .....

.....

37. තේමාව පිළිබඳව - .....

.....

38. සංරචනය කර ඇති අයුරු - .....

.....

39. වර්ණ භාවිතය පිළිබඳව - .....

.....

40. ප්‍රකාශිත හැඟීම් - .....